මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2015

----------------------------------------------------------------

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන **1971** අංක **38** දරන මුදල් පනතේ **13 (1)** වගන්තිය සහ 1998 අංක 5 දරන පනතින් සංශෝධිත (203 වන අධිකාරය) මෝටර් වාහන පනතෙහි 213 "අ" වගන්තිය හා 237 වගන්තිය යටතේ පළකල 2005 අප්‍රේල් 04 දිනැති රජයේ ගැසට් පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ **14(2)(සී)** වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03**

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.911,785 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

2014 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු. 79,109 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම පෙර වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගණුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොවීය.

| | විෂයය | ගිණුම්/ගෙවීම් වවුචර්/සනාථ ලිපි අනුව වටිනාකම් | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | රක්ෂණ ආදායම්. | 3,238,013 | තෙවන පාර්ශව ඔප්පු පිළිබද තහවුරු කිරීම. |
| (ආ) | පුහුණු වැඩසටහන් වියදම්. | 20,000 | දේශන පැවත් වූ බවට ලිඛිත සාක්ෂි. |
| (ඇ) | පොලී ආදායම | 85,808 | විස්තරාත්මක උපලේඛන |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

---

**පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.**

| **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත** | ආදායම් පනතට අනුව සභාව ආදායම් බදු වලින් නිදහස් කර නොතිබුණු බැවින් ආදායම් බදු සඳහා ලියාපදිංචි වී බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 139 | වවුචර් වලට මුදල් ගෙවීමේදී සෑම වවුචරයක්ම සහතික කිරීම සඳහා බලය ඇති පුද්ගලයකු සහතික කර ඇති බව හා ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු වුවත් ඊට පටහැනිව රු. 1,064,731ක ගෙවීම් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 751 සහ 752 (1) | රාජ්‍ය ආයතනවලට ලැබෙන හා නිකුත්කරන ලද සියළුම භාණ්ඩ බඩු ලේඛනයක හා තොග පොත්වල සටහන් කළ යුතු වුවත් සභාව විසින් මිලට ගෙන තිබූ රු. 204,436 ක් වටිනා භාණ්ඩ ලැබීම් ලේඛනගත කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ** | |
| (i) 2004 ජූලි 29 දිනැති අංක පීඊඩී/25 දරන චක්‍රලේඛය. | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. 24,476,981 ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ii) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන චක්‍රලේඛය. | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මාස 04 ක් තුල සභාවේ සභාපති වෙත ප්‍රවාහන දීමනා ලෙස රු. 40,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (iii) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58 (2) දරන චක්‍රලේඛයේ 2 ඡේදය සහ 2015 ජුනි 17 දිනැති අංක 3/2015 දරන චක්‍රලේඛයේ 2. 11 ඡේදය. | • චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සභාපතිවරයා වෙත 2015 වර්ෂයේ මාස 06 ක දී එකතුව රු. 30,000 ක් සහභාගීත්ව දීමනා ලෙස ගෙවා තිබුණි.<br>• සභා සාමාජිකයන් වෙත එක් සභා රැස්වීමක් සඳහා රු. 4,000 ක දීමනාවක් පමණක් ගෙවිය යුතු වුවද රැස්වීමක් සඳහා රු.5,000 බැගින් ගෙවීම් කිරීම නිසා සාමාජිකයන් 15 දෙනෙකු සඳහා 2015 ජනවාරි සිට ජුනි දක්වා රු. 50,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| | | • සහභාගීත්ව දීමනා සඳහා සහා සාමාජිකයන් හා නිරීක්ෂකයන් සුදුසුකම් ලබන නමුත් සභා සාමාජිකයන් නොවන සභාවේ නිළධාරින් වෙත සමාලෝචිත වර්ෂය තුළ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සහභාගීත්ව දීමනා ලෙස රු. 243,000 ක මුදලක් ගෙවා තිබුණි. |
| (iv) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන චක්‍රලේඛය හා 2014 නොවැම්බර් 17 දිනැති අංක 22/99 (XXX) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වගන්තිය. | සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයේ හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලිඛිත අනුමැතියකින් තොරව සභාවේ සේවයේ නියුතු නිළධාරියෙකුගේ පෞද්ගලික වාහනයක් සභාවේ කටයුතු සඳහා යොදවා ඒ වෙනුවෙන් රු. 139,635 ක ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිරිවැය රු.3,074,244 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | 2014 ජූනි 27 දිනැති අංක බීඩී/අයිපී/117/1/10/14 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලිපිය. | ලිපියේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ දී අධිවේගී මාර්ග භාවිතා කර රු.11,100 ක බිල්පත් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඊ) | 2015 මාර්තු 27 දිනැති අංක ඊඑස්ටී/8/ඒඑල්ඕඩබ්ලිව්එන්/05/01/02 දරන රාජ්‍ය පරිපාලන පලාත් සභා පලාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂකගේ ලිපිය | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් 2015 වර්ෂය තුළ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් 09 ක් සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සම්පත් දායක දීමනා ලෙස රු. 525,000 ක් ගෙවා තිබුණි. |

**2.4 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සභාවේ මුළු ශුද්ධ වත්කම් වලින් සියයට 89.4 ක් භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබු අතර එය ඉකුත් වර්ෂයේ සියයට 83.5 ක් විය. සභාවේ මූලික අරමුණු ඉටු කිරීමට වඩා අරමුදල් ආයෝජනය කර මුදල් ඉපැයීම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා තිබුණු බව මේ අනුව නිරීක්ෂණය විය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 25,678,296 ක අතිරික්තයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 27,647,004 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,968,708 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව රක්ෂණ ආදායම් දායකත්වය සමාලෝචිත වර්ෂයේ රු. 5,741,131 කින් වර්ධනය වුවද වාර්ෂික වියදම රු. 7,805,702 කින් ඉහල යාම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී ආයතනයේ අඛණ්ඩ මූල්‍ය අතිරික්තයන් පැවතුණ ද එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැළකිල්ලට ගැනීමේදී සභාවේ දායකත්වය 2012 වර්ෂයේ සිට

2015 වර්ෂය දක්වා උච්චාවචනය වෙමින් පැවති අතර 2013 වර්ෂයේදී පමණක් දායකත්වය සියයට 21 කින් වර්ධනය වී තිබුණි. 2012 වර්ෂය සමඟ සැසඳීමේදී 2014 හා 2015 වර්ෂයන්හිදී දායකත්වයේ සැළකියයුතු වර්ධයනයක් නිරීක්ෂණය නොවූ අතර එය වර්ධනය කරගැනීම සඳහා වූ ක්‍රමෝපායන් කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 කාර්යසාධනය**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1998 අංක 5 දරන පනතින් සංශෝධිත (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතෙහි 213 (අ) වගන්තිය යටතේ පිහිටවනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවෙහි කර්තව්‍ය පහත පරිදි වේ.

- ❖ රථවාහන ප්‍රමාණය ඒවායේ ලක්ෂණ, සංයුතිය මාර්ග අනතුරු සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා මාර්ග ආරක්ෂාව විෂයය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යාම.

- ❖ සම්බන්ධිත විෂයයන් පිළිබඳව තොරතුරු රැස් කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂණ පැවත්වීම සහ පර්යේෂණ පැවත්වීම හා එකී පර්යේෂණවලට ආධාර කිරීම .

- ❖ සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධතා පැවත්වීම සහ ඒවායේ දැනුම හුවමාරු කරගැනීම.

- ❖ මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති පිළිබඳ දැනුම සහ තොරතුරු ලබාදීම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම සහ ක්‍රියාවට නැගීම හා ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් දීම.

- ❖ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

- ❖ හඳුනා නොගත් වාහනවලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබාදීම.

ඉහත කාර්යයන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය පිහිටුවා වසර 10 ක ආසන්න කාලයක් ගතවී ඇතත් ආයතනය විසින් මෙම කර්තව්‍යයන් අතුරින් හඳුනා නොගත් වාහනවලින් අනතුරට පත් පුද්ගලයින්ට වන්දි ගෙවීම් හා මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාවට නැගීම යන කාර්යයන් 02 පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) 2015 ජූලි 15 දින සිට ජූලි 17 දින දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ ත්‍රීවිල් රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සැලසුම් කර තිබුණ ද එම වැඩසටහන පැවැත්වීම අවලංගු කර තිබූ බැවින් ඒ වෙනුවෙන් පුවත්පත් වල දැන්වීම් පල කිරීම සඳහා හා වැඩසටහන පැවැත්වීමට පෙර දරන ලද එකතුව රු. 787,573 ක වියදම් අනාර්ථික වියදම් බවට පත් වී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත වී තිබූ උප ව්‍යාපෘති 13 න් රු. 10,000,000 ක ඇස්තමේන්තු පිරිවැයක් වූ උප ව්‍යාපෘති 05 ක් 2015 දෙසැම්බර් මාසය අවසන් වන විටද ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ඇස්තමේන්තුගත වියදම රු.10,000,000 ක් වූ ව්‍යාපෘතියක් සියයට 25 ක ප්‍රගතියක් පමණක් අත්පත් කරගෙන තිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තෙවන පාර්ශව රක්ෂණ ගාස්තු මගින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලැබෙන දායක මුදලින් හඳුනා නොගත් අනතුරු වලින් සිදුවන මරණ හා තුවාලකරුවන්ට ගෙවන වන්දි මුදල් ද ඇතුළුව මුළු වියදම 2014 වර්ෂයේ දී සියයට 28.2 ක්ව තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 42.1 ක් දක්වා ඉහළ ගියද 2015 වර්ෂය දක්වා ලැබූ මුළු අයදුම්පත් 430 න් අයදුම්පත් 70 ක් ප්‍රතික්ෂේප කර 219 ක් සඳහා වන්දි ගෙවා තිබූ අතර තවදුරටත් වන්දි ගෙවිය යුතු අයදුම්පත් සංඛ්‍යාව 141 ක් වී තිබුණි. මෙයින් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබූ අයදුම්පත් 50 ක් සඳහා අයදුම්පත් ලැබී මාස 06 සිට වසර 02 ක කාල ප්‍රමාදයකින් පසුව රු. 4,525,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි.

(ආ) නිසි සැලසුම් නොමැතිව වැඩසටහන් ඇරඹීම නිසා අවස්ථා 10 කදී ලබා ගත් රු.498,500 ක අත්තිකාරම් මුදලින් රු. 220,862 ක් ඉතිරි වී තිබුණු අතර එය ලබා ගත් අත්තිකාරම් මුදලින් සියයට 34 සිට සියයට 75 දක්වා පරාසයක විය.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 අගෝස්තු 26 දිනැති අංක අමප/10/1883/445/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මගින් භාණ්ඩාගාරය මත අමතර වැය බරක් නොවන පරිදි අවම පිරිවැයක් මත ජාතික මාර්ග ආරක්ෂණ කොමිසම ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කර එහි සංයුතිය, ව්‍යුහය හා කාර්යභාරය ඇතුළත් නව පනතක් පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණු මෙම සභාව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිහිටුවා වසර 10 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද, මහා භාණ්ඩාගාරයෙන් ස්ථිර කාර්ය මණ්ඩලයක් සඳහා අනුමැතිය ලබාගෙන බඳවා ගැනීම් සිදු කිරීමට පියවර නොගෙන ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ලවා රාජකාරි ඉටුකරවා ගෙන තිබුණි.

## 4.4 සමාජ වගකීම්

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මාරක අනතුරු 56,392 ක් වාර්තා වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී අනතුරු සංඛ්‍යාව පෙර වර්ෂයට වඩා සියයට 10.5 කින් ඉහළ ගොස් තිබුණි. තවද එම අනතුරු වලින් හඳුනා නොගත් අනතුරු කොපමණද යන්න හඳුනා ගැනීම සඳහා නිශ්චිත ක්‍රම වේදයක් සභාව සතුව නොතිබුණි. මේ අනුව සමාජ වගකීම් ඉටු කිරීමෙහිලා සභාවේ අරමුණු හා කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ත්‍රිරෝද රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන් 5 ක් සඳහා රු.469,687 ක් වැය කර තිබුණ ද ත්‍රිරෝද රථ මගින් සිදු වූ මාරක අනතුරු සංඛ්‍යාව 2014 වර්ෂයේ මුල් මාස 06 යේ දී 131 ක් හා 2015 වර්ෂයේ මුල් මාස 06 දී අනතුරු 177 ක් බැවින් අනතුරු ප්‍රමාණය සියයට 35 ක ප්‍රමාණයකින් වර්ධනය වී තිබුණි. මේ අනුව සභාවේ වියදමට සාපේක්ෂව අපේක්ෂිත සමාජ මෙහෙවර ඉටු වී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් 2011 වර්ෂයේ සිට 2020 දක්වා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම පරීක්ෂා කිරීමේ දී එය අධ්‍යක්ෂ මණ්ඩලය සහ ලේකම් අනුමත කර නොතිබුණු අතර 2011 වර්ෂයෙන් පසුව සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. තවද සැලැස්මට ඇතුළත් කල යුතු පහත සඳහන් අංග ඇතුලත් කර නොතිබුණි.

(අ) සභාවේ ශක්ති අවස්ථා, බාධක හා දුර්වලතා හඳුනාගෙන ඒ පිළිබඳ ඇගයීමක් සිදුකිරීම.

(ආ) ව්‍යාපාරික අරමුණු ඉටු කරවා ගැනීම සඳහා උචිත ක්‍රමවේදයන් (Strategies) හඳුනාගැනීම.

(ඇ) කාලීනව ළඟාකර ගත යුතු ඉලක්කයන් (Targets) ස්ථාපිත කිරීම හා එම ඉලක්කයන් සපුරා ගැනීමේ වගකීම මෙහෙයුම් මට්ටම දක්වා තර්කානුකූලව බෙදා හැරීම.

### 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 05 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කල යුතු වුවද, 2015 වර්ෂය තුල සංයුක්ත සැලැස්ම යාවත්කාලීන නොකිරීම නිසා ක්රියාකාරී සැලැස්ම නිවැරදිව සකස් කර නොතිබුණි.

### 5.3 අයවැය පාලනය

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් පැහැදිලිව හඳුනාගත හැකි වන පරිදි අයවැය ඇස්තමේන්තු සකස් කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය තුල අන්තර්ගත රු. 26,600,000 ක වියදම් පැහැදිලිව වෙන් කර හඳුනාගත නොහැකි විය.

### 5.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

සැලසුම් කල ප්‍රධාන සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වුවද රු. 5,400,000 ක් වූ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

**සභාවේ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ විවිධ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර තිබූ අතර පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතු වේ.**

| | **පද්ධති හා පාලන ක්ෂේත්‍රය** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | අනුමැතියකින් තොරව ජ'නල් සටහන් යෙදීම. |
| (ආ) | ආදායම් පාලනය | සියළුම රක්ෂණ සමාගම්වල තුන්වන පාර්ශවයේ මෝටර්රථ වාහන රක්ෂණ ගාස්තුවලට අදාළ දායක මුදල් එක්රැස් කර ගැනීම සඳහා විධිමත් දත්ත පද්ධතියක් නඩත්තු නොකිරීම. |
| (ඇ) | වන්දි ගෙවීම | වන්දි ගෙවීමේ කාල පමාවන් සිදුවීම. |
| (ඈ) | සැලසුම් කිරීම හා අයවැය පාලනය | සංයුක්ත සැලැස්මක්, ක්‍රියාකාරී සැලැස්මක් හා අයවැය ලේඛනයක් පිළියෙල කිරීමේදී ආයතනය පිහිටුවීමේ අරමුණු මුදුන්පත් වන ආකාරයට පිළියෙල කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | මුදල් පාලනය | සීමාවන් තුළ අත්තිකාරම් ලබා නොදීම. |